# ස්වයං අධ්‍යයනයට අත්වැලක්

- **ශ්‍රේණිය** - 6 ශ්‍රේණිය - පළවන වාරය
- **නිපුණතාවය** **4.0** - ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනාවල පසුබිම අධ්‍යනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි
- **නිපුණතා මට්ටම** **4.1** - නියමිත ගායනා වල සංස්කෘතික පසුබිම විස්තර කරයි
- **ක්‍රියාකාරකම** **4.1.1** - ශ්‍රී ලාංකේය ජන ගායනා හඳුනා ගනිමු. **(නැළවිලි,ලී කෙළි,කළගෙඩි)**




**සැකසුම** :- සමන්ති පුණ්‍යවර්ධන
මප/වත්/මහනුවර ආදර්ශ විදුහල
පොල්ගොල්ල

**මෙහෙයවීම** :- නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කලාපය
වත්තේගම

**උපදෙස් :-** මෙය ලිඛිත පාඩමකි.මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යනය කිරිම සඳහා පාසල් ගුරු ඇසුර ලබාගත යුතුය.

**හැඳින්වීම :-**

**මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ :-**

- ශ්‍රී ලාංකේය ජන ගායනා හඳුනා ගැනීම
- නැළවිළි, ලී කෙළි, කලගෙඩි කවිවල සංස්කෘතික පසුබිම විස්තර කිරීම
- වන්නම් ගායනය පිළිබඳ පසුබිම විස්තර කිරීම
- ජන ගායනාවල භාෂාව, අර්ථය හා නාද රටාව පැහැදිළි කිරීම
- නියමිත ගායනවල අන්තර්ගතය පැහැදිළි කිරීම
- ජන ගායනා වල ලක්ෂණ විස්තර කිරීම
- ජන ගායනා යොදාගන්නා අවස්ථා හඳුනාගැනීම

- **ඉහත කරුණු අධ්‍යනය සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත වෙමු.**

## ක්‍රියාකාරකම

**පියවර 01 :-**

" ඈතින් පෙනෙන කඳු ගැටයකි. ඒ මතින් ගලනා දොළ පාරකි. ඈතින් පිදුරැ සෙවිලි කළ පැල්පත් කිහිපයකි. කඳුගැට පෙලට පහලින් නිල් පැහැයෙන් දිදුලන කෙත් යායකි. උදලු හා දෑකැති අතින් ගත් ගොවි ගෙවිලියන් කුඹුරට පා තබන අයුරු ඉතාමත් දැකුම්කළු ය. හිස මත කළ තබාගත් කාන්තාවන් ලාලිත්‍යයෙන් දිය ගෙන ඒමට පියමන් කරයි."

මෙම කතා පුවත් කොටස කියවීමෙන් සුන්දර ගැමි පරිසරයක් ඔබේ හිතට නැගෙන්නට ඇත. මෙහි කෘෂිකාර්මික දිවි පෙවතක් ගත කරන ජන සමූහය තම පාළුව, කාන්සිය, වෙහෙස මගහරවා ගැනීමට කවි ගායනය, නැටීම ආදියේ යෙදෙන්නට ඇත.

දැන් ඔබ පෙර පාසලේදී හා ප්‍රාථමික අංශයේදී සිදුකළ ලී පොලු, කලගෙඩි, බෝනික්කන් ආදිය රැගෙන සිදුකළ ගායනය සහිත ක්‍රියාකාරකම් මතකයට නගන්න. එසේම 5 ශ්‍රේණියේදී හනුමා වන්නමද ඔබ ශබ්ද නගා ගායනා කළ මතකයන් ඇත.

අද අපි මෙම පාඩමෙන් ඉගෙනීමට සූදානම් වන්නේ මෙවැනි කවි ගායනාවන් පිළිබඳ මෙතෙක් හඳුනා නොගත් තොරතුරු ය.

**පියවර 02 :-	ජන ගායනා හඳුනා ගනිමු**

- විවිධ ජීවන වෘත්තීන්වල ජීවත්වන ජන සමූහයා විවිධ අවශ්‍යතාවන් සඳහා ජන ගායනා යොදාගෙන ඇත
- එම ජන ගායනා රැසක් අතරින් අප මෙහිදී සාකච්ඡා කරනුයේ නැළවිලි, ලී කෙළි, කලගෙඩි හා වන්නම් ගායනය පිළිබඳවය.
- ඒවා ආරම්භය, අන්තර්ගතය, විකාශය හා භාවිතය පිළිබඳව වෙන් වශයෙන් හඳුනාගත හැකිය.

**පියවර 03 :-	නැළවිලි කවි හඳුනා ගනිමු.**



මෙම රූපය දැකීමෙන් ඔබ අසා ඇති කවියක් සිතට නැගෙනු ඇත.

| | |
|---|---|
| නුඹේ අම්මා කොතැන	ගියේ<br>කිරි එරවා එන්ට	ගියේ<br>කිරි මුට්ටිය ගඟේ	ගියේ<br>ගඟට උඩින් කොක්කු	ගියේ | අතට වෙරළු ඇඹිද	ගෙනේ<br>ඉනට පලා නෙලා	ගෙනේ<br>බරටම දර කඩා	ගෙනේ<br>එයි අම්මා විගස	කිනේ |

- කුඩා දරුවන් නැලවීම සඳහා යොදාගනී.
- ලයාන්විත හඬකින් ගායනා කරයි.
- සෑම ජන කොට්ඨාශයකටම පොදු ගායනා වර්ගයකි.

## පියවර 04 :- ලී කෙලි කවි හඳුනා ගනිමු




| | |
|---|---|
| එක පඳුරෙන් ලී සයක් කපාගෙන | බෝ අත්තට වැඳ සිරස නමන්නේ |
| එක උස ඇති සදෙනෙක් තෝරාගෙන | ආපස්සට වැඳ මුන පෙරළන්නේ |
| ගුරුන් අතට දී ලී බෙදවාගෙන | ඒ පැත්තේ අය අප හඳුනන්නේ |
| අපිත් කෙළිමු ලී දෙපිල සැදීගෙන | බෝ පත්තිනි මට අවසර දෙන්නේ |

- ගැමියන් තම විනෝදාස්වාදය සඳහා ගායනා කරයි
- ලී කෙලි කවි තුලින් ඉහත කරුණු සනාථ වේ.
- සරල නාද රටා, සරල තාල මෙම කවිවලට යොදාගෙන ඇත.
- ඉතා සරල වචන භවිතා කර ඇත.

## පියවර 05 :- කළගෙඩි කවි හඳුනා ගනිමු.




| | |
|---|---|
| අහසට පිඹිනා එරං කළේයා | පේළි සැදී අගනෝ සැරසීලා |
| පොළවට පිඹිනා භූමි කළේයා | නීල වරල කුසුමෙන් ගවසාලා |
| රන්මසු දහසක් වටින කළේයා | කෝල නොවී සබ මැදට වැදීලා |
| නො බිඳින් නෑනෝ මගේ කළේයා | බාල ලියෝ කළ පිඹිති සැදීලා |

- විනෝදාස්වාදය සඳහා නිර්මාණය වී ඇත
- කවි වලින් කාන්තා හැඩරුව, දියට යෑම, රූප ස්වභාවය, නෑම, උසුළු විසුළු කිරීම, කලය නිර්මාණය කරගන්නා ආකාරය පිළිබිඹු වේ.
- කළගෙඩි කවි වලින් ඉහත කරුණු සනාත වේ.

## පියවර 06 :- වන්නම් ගායනය හඳුනා ගනිමු

- වන්නම් සම්ප්‍රදායන් තුනටම පොදු ය.




- වන්නම් ගායනයට රචනා වී ඇත.
- පසු කාලයේදී නර්තනය යොදාගෙන ඇත.
- වන්නම් නිර්මාණය සඳහා පහත සඳහන් ස්ථාන සම්බන්ධ වී ඇත.




- වන්නම් උඩරට හා සබරගමු සම්ප්‍රධායන් වලදී වන්නම් ලෙසද, පහතරට සම්ප්‍රධායේදී සින්දු වන්නම් ලෙසද හඳුන්වයි.
- සම්ප්‍රධාය අනුව නාදමාලා සැකසී ඇත.
- සෑම වන්නමකම නාදමාලාව තානම මගින් හඳුනාගත හැක.

* **හනුමා වන්නම**

- **තානම**

තනත් තනත් තම් දනත් තනම්දන
තනම් දනත් තනෙනා - තෙයි
තනත් තනත් තම් දනත් තනම්දන
තනම් දනත් තනෙනා

- **කවිය**

ගිරෙන් ගිරට පැන ලැගුම් සොයා පුබුදිමින්
අරුණ කළ මා - ගොර
දෙමින් නැවත වටපිටින් බලති නෙක
උසුළු විසුළු පුදුමා

**පියවර 07 :- ජන ගායනා සංරක්ෂණය සඳහා යෝජනා ඉදිරිපත් කරමු.**

- ජනගායනා මිනිසුන්ට රසවිඳීමට සැළැස්වීම
- ජනගායනා ගුවන්විදුලි මාධ්‍ය මගින් ප්‍රචාරය කිරීම
- ජනගායනා ගැන පුවත්පත්වලට ලිපි සැපයීම
- ජනගායනා වැඩසටහන් රූපවාහිනිය මගින් විකාශය කිරීම
- ජනගායනා ඇතුළත් ග්‍රන්ථ රචනා කිරීම

ඉහත පාඩම අදාළ පියවර අනුගමනය කරමින් නිරත වන ලද මෙම ක්‍රියාකාරකම් නිසා අදාල ජන ගායනවල සමාජීය හා සංස්කෘතික පසුබිම පිළිබද යම් අවබෝධයක් ඔබට ලැබෙන්නට ඇත.